**වී අලෙවි මණ්ඩලය - 2021**

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

වී අලෙවි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාද වීම හේතුවෙන් මණ්ඩලය සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2023 ජනවාරි 18 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. තවද පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය වියාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ.කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ තොග නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය හා වී මෙට්‍රික් ටොන් 20,000 ක් රු. මිලියන 880 කට සතොස ආයතනයට නිකුත් කිරීමේදී මහා භාණ්ඩාගාරය ඇප වී ඇති ප්‍රමාණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 36 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව තොග නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය හා භාණ්ඩාගාරය ඇප වී ඇති තොගය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර පූර්ව වර්ෂයට අදාළව සිදු කර තිබූ රු.336,992,907 ක් වූ ගැළපීම් රඳවාගත් ඉපැයීම්වලට ගළපා තිබූ අතර ප්‍රමිතියේ 49 ඡේදය ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී පූර්ව කාලපරිච්ඡේද වල සිදු වන දෝෂ වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමට සහ ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය අනුව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවම වශයෙන් සෑම මුදල් වර්ෂයක් | වත්කම් පිළිබඳ තහවුරු ලබාගෙන තක්සේරු කර ඉදිරි වර්ෂවලදී ගැලපීමට කටයුතු කරනු ඇත. | සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වූ වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අවශේෂ වටිනාකම සහ |

| | | | |
|---|---|---|---|
| | අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත තත්ත්වයන් ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වූ කාණ්ඩ 08 කට අයත් 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.84,132,668 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | ප්‍රයෝජනවත් ජීවිත කාලය හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වසර 04 ඉක්මවූ එකතුව රු.5,685,811,329 ක් වූ වෙළඳ ලැබිය යුතු ශේෂ 19 ක් පැවතුණ ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 හි 58 ඡේදය ප්‍රකාරව අයකර ගැනීම අවිනිශ්චිත ණයගැති ශේෂ සඳහා වෙන් කිරීම් කර නොතිබුණි. | අවිනිශ්චිත ශේෂ සඳහා විශේෂ කමිටුවක් පත්කර නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අයවීම අවිනිශ්චිත ණයගැති ශේෂ සම්බන්ධයෙන් වෙන් කිරීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මණ්ඩලය විසින් එකතුව රු.10,459,680 ක මුදලක් අයකර ගැනීම සඳහා පුද්ගලික සහල් මෝල් හිමියන් 05 දෙනෙකුට හා පෞද්ගලික සමාගමකට එරෙහිව අධිකරණවල පවරා තිබුණු නඩු සහ මණ්ඩලයට එරෙහිව පුද්ගලයින් 04 දෙනෙකු විසින් කම්කරු විනිශ්චය සභාවල සහ දිසා අධිකරණයක පවරා තිබුණු නඩු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සිදු කිරීම හෝ අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අධිකරණවල පවරා ඇති නඩු අවිනිශ්චිත වගකීම් ලෙස සහ ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවසාන තොගය දැක්වීමේදී භෞතික ආගණනයකින් තොරව පොත් අගය මත පදනම්ව වී කිලෝග්‍රෑම් 5,316,218 ක වටිනාකම රු.280,928,112 ක් | විශාල තොග පවතින ගබඩා වල භෞතික තොග සත්‍යාපනයක් වාර්ෂිකව සිදු කිරීම ඉතා දුෂ්කර වීම හා ඒ සඳහා ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් | අවසාන තොගය භෞතිකව ආගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රමාණවත් නොවීම හේතුවෙනි. | |
| (ආ) | 2018 පෙබරවාරි සිට 2021 දෙසැම්බර් 30 දක්වා කාලය තුළ අවස්ථා 501 කදී බැංකු ගිණුමකට සෘජුව බැර වී තිබුණු රු.3,805,475 ක් වූ තැන්පතු සහ බැංකු ගිණුමක තැන්පත් කර තිබුණු හඳුනා නොගත් රු.1,179,892 ක් වූ තැන්පතු 16 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද රු.2,995,793,781 ක් වූ බැංකු ගිණුම් 05 කට අදාළ විවිධ ලැබීම් තැන්පත් කළ නමුත් බැංකුවට බැර නොවූ තැන්පතු ලෙස අවුරුදු 10 සිට මාස 07 දක්වා කාලයක් තිස්සේ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. | හඳුනානොගත් තැන්පත් බැංකුව මඟින් තහවුරු කර රිසිට්පත් නිකුත් කර මුදල් පොත්වලට ඇතුලත් කිරීමටත් නිරවුල් නොවූ ගණුදෙනු හිස් චෙක්පත් සඳහා රිසිට්පත් නිකුත් කිරීමක් වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුවත් කර අනුමැතිය ලබාගෙන අයවිය යුතු ශේෂයක් පවතීනම් අදාළ නිළධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ඇත. | සෘජු තැන්පතු සහ අනෙකුත් හඳුනා නොගත් තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත් තැන්පත් කළ නමුත් බැර නොවූ තැන්පතු නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | බැංකු ගිණුම් 02 කට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථන අනුව ශේෂය පිළිවෙලින් රු.29,806,394 ක් හා රු.40,780 ක් වූවද මුදල් පොත අනුව ශේෂ පිළිවෙලින් රු.34,806,394 ක් හා රු.25,000 ක් වීමෙන් රු.4,984,220 ක වෙනසක් පැවතුණි. | දෙවරක් මුදල් පොතට ඇතුලත් කර ඇති මෙම හර කිරීම නිවැරදි කිරීමටත් බැංකුව වෙත සෘජුව තැන්පත් කර ඇති තැන්පතු මුදල 2022 වර්ෂයේ මුදල් පොතට ඇතුලත් කර නිවැරදි කිරීමටත් කටයුතු කරනු ඇත. | සිදුව ඇති වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2020 හා 2021 වර්ෂවල දී කලාප කාර්යාල 07 ක වී මිලදී ගැනීමේ මෙහෙයුම් වියදම් ඇතුළු පුනරාවර්තන වියදම් සඳහා ලබා දී තිබූ එකතුව රු.51,926,299 ක් වූ අත්තිකාරම්වලට අදාළ පියවීම් සහතික කර නොතිබූ අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වියදම් හා වගකීම් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ අලාභය හා වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 2020 හා 2021 වර්ෂවලට අත්තිකාරම් වලට අදාල පියවීම් වවුචර්පත් 2022, 2023 වර්ෂවල සහතික කිරීම් සිදු කර තිබීම මත 2020 හා 2021 වර්ෂයේ ලාභයට ගැලපීම් කර ඇත. | කලාප කාර්යාලවලට ලබාදෙන අත්තිකාරම් පියවීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මණ්ඩලය නමින් ලියාපදිංචි කර තිබුණු සහ මණ්ඩලය සතුව පැවති මෝටර් රථ 08 ක් 2021 දෙසැම්බර් 31 දිනට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මණ්ඩලය සතු මෝටර් රථ තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | සියළු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වියළි බර සඳහා අවසාන වී තොගයෙන් සියයට 3 ක් එනම්, රු.1,217,126,761 ක ප්‍රතිපාදනයක් 2018 වසරේ සිට ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණ ද ඊට අදාල වියදම විගණනයට සනාථ නොකෙරුණි. | මෙම ශේෂ නිරවුල් කර ගැනීමට විශේෂ කමිටුවක් පත් කර තොරතුරු සොයා අදාල ගැලපීම් සිදු කර ගත යුතුය. | ප්‍රතිපාදනයන්ට අදාළ නිවැරදි උපයෝගීතා ලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2021 වර්ෂයට අදාළව අනුරාධපුර කලාප කාර්යාලය විගණනය වෙත ඉදිරිපත් කළ තොග වාර්තා හා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබූ තොග වාර්තා සැසඳීමේදී ආරම්භක වී තොගයට අදාළව ප්‍රමාණ අතර කිලෝග්‍රෑම් 213,749 ක හා වටිනාකම් අතර රු.10,751,373 ක වෙනසක් ද වී තොග මිල දී ගැනීම්වල වටිනාකම් අතර රු.555,533 ක වෙනසක් ද, වී තොග නිකුත් කිරීම්වලට අදාළව ප්‍රමාණ අතර කිලෝග්‍රෑම් 192,103 ක වෙනසක් ද පැවතුණි. | 2021 ජනවාරි 01 දිනට ආරම්භක තොගයෙහි වරද 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමටත් පොලිසැක් මළු සඳහා දරන ලද රු.555,480 මුදල ද ඇතුලත් කර තිබීම සහ ප්‍රධාන කාර්යාලය වාර්තාවේ වී වල වටිනාකම පමණක් ඇතුලත් කර තිබීමත් වී කිලෝග්රෑම් 192,103 ක වෙනස්වීමේ වරද 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමටත් කටයුතු කරනු ලබයි. | තොග නිවැරදිව ගිණුම්ගත කිරීමටත් ඒවා අදාළ උපලේඛන හා පොත්පත්වල ඇතුළත් සංඛ්‍යා සමඟ සැසඳීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ණයගැතියෝ (ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව) | 436,543,583 | 347,890,000 | 88,653,583 | සනාථ නොවූ මෙම ණයගැති ශේෂ වසර ගණනාවක් පැරණි වන බැවින් ශේෂ සනාථ කිරීම් ලබාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකරනු ඇත. | ශේෂ සනාථන ලබාගෙන සැසඳීම් සිදුකර ගිණුම්වල නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ණයගැතියෝ (ලංකා සතොස) | 1,126,323,604 | 1,024,255,120 | 102,068,484 | | |

### 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| | විෂය | මුදල (රු.) | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අවිනිශ්චිත ගිණුම් | 3,049,830,238 | වසර 2 ත් 5 ත් අතර | අවිනිශ්චිත ගිණුම් හා මාර්ගස්ථ තොග පිළිබඳ සොයා බලා ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | අවිනිශ්චිත ශේෂ නොපමාව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මාර්ගස්ථ තොග | 2,234,953 | වසර 03 කට අධික | | |

### 1.5.5 මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් ආසන්න වර්ෂ 9 ක් තුළ මණ්ඩලය රු.462,105,320 සිට රු.5,894,325,856 ක් දක්වා වූ පරාසයකින් අඛණ්ඩව ඌනතාවයන් වාර්තා කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු.1,385,111,144 ක් විය. තවද සමාලෝචිත වර්ෂය අවසානයේ සෘණ ස්කන්ධ ප්‍රාග්ධන වටිනාකම රු.14,140,932,491 ක් වී තිබූ අතර මූළ වත්කම් ඉක්මවා දීර්ඝ කාලයක් තිස්සේ මූළ වගකීම් පැවතීම හේතුවෙන් ස්කන්ධය දිගින් දිගටම සෘණ අගයක් ගෙන තිබුණි. මේ හේතුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගැනීමෙන් තොරව මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. මෙවැනි තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවදානමට ලක්ව තිබුණ ද කළමනාකාරීත්වය ඒ පිළිබඳ අවධානය යොමු කර අවශ්‍ය පියවර ගැනීමටත් ගිණුම්වල හෙළිදරව් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරීත්වය විසින් වැඩිපුර අවධානය යොමුකළ යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම්ද සිදුකළ යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු ශේෂ 8 ක එකතුව රු. 461,677,824 ක් සහ ගෙවිය යුතු ශේෂ 09 ක එකතුව රු.65,516,702 ක් සඳහා විස්තරාත්මක උපලේඛන ද, එකතුව රු.1,703,297,369 ක් වූ ලැබිය යුතු ශේෂ 07 ක් සහ එකතුව රු.253,055,091 ක් වූ ගෙවිය යුතු ශේෂ 09 ක් සඳහා තහවුරු කිරීමේ ලේඛන ද විගණනයට ඉදිරිපත් නොවීය. | 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ හා ගෙවිය යුතු ශේෂ වසර ගණනාවක් පැරණි ශේෂ වන බැවින් නිරවුල් කර ගැනීමට විශේෂ කමිටුවක් පත් කර තොරතුරු සොයා අදාළ ගැලපීම් සිදු කර ගත යුතුය. | ගිණුම් විෂයන්හි වටිනාකම තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතු අතර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට රු.7,096,359,350 ක් වූ ණයහිමි ශේෂය තුළ වසර 05 ට වැඩි රු.6,934,601,287 ක්, වසර 04 - 05 අතර රු.20,621,251 ක්, වසර 03 - 04 අතර රු.3,629,543 ක්, වසර 02 - 03 අතර රු.33,924,190 ක්, වසර 01- 02 අතර රු.10,251,678 ක් පැවතුණු අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිරවුල් නොකරන ලද ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.156,188,191 ක් වූ නොපිය වූ අත්තිකාරම් ශේෂයෙන් රු.54,226,634 ක් වසර 5 කට වැඩි කාලයක් ද, රු.15,948,760 ක් වසර 2 ත් 5 ත් අතර කාලයක් ද, රු.86,012,797 ක් වර්ෂයකට වැඩි කාලයක් ද පැරණි ශේෂයන් වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | තවදුරටත් පියවීමට පවතින අත්තිකාරම් අදාල නිලධාරින්ගෙන් පියවා ගැනීමට හෝ අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | නොපියවූ අත්තිකාරම් නොපමාව පියවීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| | (i) මුදල් රෙගුලාසි 387 | ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ගැනීම තහනම් වුවත් මණ්ඩලයේ බැංකු ගිණුමකට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ රු.69,449,720 ක අයිරා ශේෂයක් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | මනා මූල්‍ය කළමනාකරණය ක් තුලින් බැංකු අයිරා ලබාගැනීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 396 | 2021 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 10 කට අදාළව නිකුත් කර මාස 06 ත් අවුරුදු 05 ත් අතර කාලය ඉක්මවූ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.3,063,966,570 ක් වටිනා චෙක්පත් 83 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිකුත් කල නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් නිකුත් කර ඇති චෙක්පත් බැංකුවට ගෙවීමට ඉදිරිපත් නොවීම සම්බන්ධව මු.රෙ. 396 ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 | 2019 වර්ෂයේ සිට ඉකුත් වර්ෂ 05 ක් සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර හෝ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා හෝ නොතිබුණි. | මණ්ඩලයේ පැවති මාණ්ඩලික හා අනෙකුත් නිලධාරීන්ගේ පුරප්පාඩු හා අනෙක් විශේෂ හේතූන් මත ගබඩා හා වත්කම් සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනය කර ගැනීමට අපහසු වී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදය | 2018 වසරේ සිට මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද වත්කම් සම්බන්ධයෙන් තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් | මණ්ඩලය විසින් අපහරණය කරන ලද වත්කම් නොතිබෙන අතර, මිලදී ගෙන ඇති වත්කම් පිළිබඳ කොම්ප්ට්‍රෝලර් | වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ |

| | | | | |
|---|---|---|---|---|
| | | කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | යුතුය. |
| (ඇ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ (2)(i) ඡේදය | මණ්ඩලය නමින් ලියාපදිංචි කර නොමැති එහෙත් මණ්ඩලය භාවිතා කරන වාහන 05 ක් ලියාපදිංචි කර ගැනීමට හෝ ලියාපදිංචි ආයතනය වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කර නොතිබුණි. | HH-6041 රථය ඉදිරියේදී වාහන අපහරණ කටයුතු සිදුකරන තෙක් මණ්ඩලය භාරයේ තබාගැනීමටත් (PG-1133 වාහනය වනජීවී අමාත්‍යාංශය මගින් ආපසු ලබාගැනීමේ පදනම මත තාවකාලිකව මණ්ඩලය වෙත ලබා දී ඇත.) GD-2079 රථය වෙළඳ අමාත්‍යාංශය මගින් කෘෂිකර්ම අමාත්‍යාංශයට පැවරීමෙන් පසුව අපහරනය සිදු කිරීමටත් KY-5290, KY-7364 පවරා ගැනීමටත් අවශ්‍ය කටයුතු කරමි. | මණ්ඩලය නමින් ලියාපදිංචි කර නොමැති එහෙත් මණ්ඩලය භාවිතා කරන වාහන ලියාපදිංචි කර ගැනීමට හෝ ලියාපදිංචි ආයතනය වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2017, 2018 හා 2020 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා විගණිත දිනය වූ 2025 ජුලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2017 හා 2018 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කර ඇති අතර 2020 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි අනුමැතිය සහ සහතිකය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. | නියමිත දිනට පෙර වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,385,111,144 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,398,170,883 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,059,739 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට

ආදායම රු.2.499,401,268 කින් වැඩි වී තිබියදී විකුණුම් පිරිවැය ද රු.2,391,484,523 කින් වැඩිවීමත්, මූල්‍ය වියදම රු.183,132,600 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ මූලික අරමුණ සහතික මිලට වී අස්වැන්න මිලදී ගැනීම තුළින් ගොවි ජනතාවගේ දිළිඳුකම අඩු කිරීම සහ ආරක්ෂිත තොගයක් පවත්වා ගනිමින් රට තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම වන අතර මේ සඳහා මණ්ඩලය සතුව මෙට්‍රික් ටොන් 326,710 ක ධාරිතාවයකින් යුත් ගබඩා 353 ක් පැවතුනි. එසේ වුවද මණ්ඩලය විසින් 2021 වර්ෂය තුළ රු.2,895,946,648 කට වී මෙට්‍රික් ටොන් 52,444 ක් පමණක් මිලදී ගෙන තිබූ අතර ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2021 අනුව වර්ෂය තුළ සහල් මෙට්‍රික් ටොන් 147,000 ක් ආනයනය කිරීමට සිදුවීමෙන් ආරක්ෂිත තොගයක් පවත්වා ගනිමින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට නොහැකිව තිබුණි. තවද 2025 මහ කන්නය අවසානයේ 2025 අප්‍රේල් 10 දින වන විට මණ්ඩලය සතුව පැවති මුළු වී තොගය මෙට්‍රික් ටොන් 59.6 පමණක් වූ අතර ඊට අදාළව උපයෝජනය කර තිබුණේ මුළු ගබඩා ධාරිතාවයෙන් සියයට 0.02 ක් පමණක් විය. | මණ්ඩලය විසින් වී මිලදී ගැනීම ආරම්භ කිරීමත් සමඟ බොහෝ ප්‍රදේශවල රජය තීරණය කරන සහතික මිල ඉක්මවා වී මිලදී ගැනීමට පෞද්ගලික අංශ ක්‍රියාත්මක වීම මත මණ්ඩලයට වී ලැබීමේ ප්‍රවණතාවයක් නොතිබිණි. සහතික මිලට හෝ ඊට අඩු මිලට වී මිලදී ගැනීමට මණ්ඩලයට සිදු වන බැවින් අපේක්ෂිත වී මිලදී ගැනීමේ ඉලක්කවලට ලඟා වීමට නොහැකි වී ඇත. | මණ්ඩලයේ මූලික අරමුණු ලඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 - 2019 කාලය තුළ වී මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් මණ්ඩලයට ලබාදුන් රු.10,803,000,000 ක ණය මුදලින් රු.6,684,554,538 ක් 2025 ජූලි 18 දින දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ලබා ගන්නා ණය මුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීමටත් භාණ්ඩාගාර ණය ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වී අලෙවි මණ්ඩලය වෙත වී මිලදී ගැනීම සඳහා 2012 සිට 2019 වර්ෂය දක්වා ලංකා බැංකුව හා මහජන බැංකුව විසින් ලබා දී ඇති ඔඩපණ ණය ආපසු ගෙවීමට මණ්ඩලයට හැකියාව නොමැති වීමෙන් 2020 සිට 2028 වර්ෂය දක්වා එම ණය වාරික, පොලී මුදල් හා ප්‍රමාද ගාස්තු ඉහත බැංකුවලට ගෙවීමට මහා භාණ්ඩාගාරයට සිදු වී තිබුණි. ඒ අනුව 2020 සිට 2025 අප්‍රේල් දක්වා මහා භාණ්ඩාගාරය විසින් මණ්ඩලය වෙනුවෙන් එම බැංකු 2 වෙත රු.12,456,567,732 ක් ගෙවා තිබුණි. 2025 මැයි සිට 2028 සැප්තැම්බර් දක්වා රු.8,438,865,811 ක් තවදුරටත් ගෙවිය යුතුව පවතී. | 2012 – 2019 යන වර්ෂයන් තුළ එවකට පැවති රජයන් විසින් එක් එක් අවස්ථා වලදී ගනු ලැබූ තීරණ අනුව මණ්ඩලය විසින් වී මිලදී ගැනීම සඳහා ලබාගත් ණය මුදල් ගෙවා අවසන් කිරීමට නොහැකි වී ඇත. රජය විසින් ගොවියාද පාරිභෝගිකයාද යන දෙපාර්ශවයම තෘප්තිමත් වන අයුරින් ගනු ලැබූ තීන්දු තීරණ මත මණ්ඩලය විසින් මිලදීගත් වී තොග, මිලදී ගත් මිල හා ඒ සඳහා දැරූ පිරිවැයටත් වඩා අඩු මුදලකට සහල් සැකසීම වෙනුවෙන් යොදවා ඇති බැවින් විශාල පාඩුවක් සිදු වී ඇත. | ණය මුදල් අදාල කාර්යයට යෙදවීමට හා කාර්යක්ෂමව කළමනාකරණය කරගනිමින් ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මනා වියදම් කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් මණ්ඩලය විසින් ඔඩපණ ණයට අමතරව ලබාගෙන තිබූ අනෙකුත් ණය සඳහා වූ වාරික හා පොලිය නියමිත පරිදි නොගෙවීම මත 2021 මාර්තු 23 දින රු.1,244,147 ක ප්‍රමාද දඩ ගාස්තුවක් ගෙවීමට සිදු වී තිබුණි. | 2019/20 මහ කන්නයේදී වී අලෙවි මණ්ඩලය මගින් ලබාගත් ණය මුදල් වලින් මණ්ඩලය හා දිසාපතිවරුන් හරහා වී තොග මිලදී ගෙන සහල් කර වෙළඳපලට නිකුත් කර ඇත. එහිදී ලබාගත් ණය මුදල් වලින් කොටසක් දිසාපතිවරුන් විසින් එම වර්ෂයේ දීම පියවීම් කර ඇති අතර, ඉතිරි මුදල් වී සහල් කර විකිණීමෙන් ලද ආදායමින් මණ්ඩලය වෙත ලබාදී ඇත. එම අවස්ථාවේදී මුදල් ලැබීම ප්‍රමාද වීම මත හා මණ්ඩලයේ වී තොග සහල් කර සුපිරි වෙළඳසැල් හරහා ණයට විකිණීමෙන් ලැබිය යුතු මුදල් ලබාදීම ප්‍රමාද වීම මත ණය මුදල්වලට අදාල පොලී මුදල් නියමිත දිනට ගෙවීමට නොහැකි වී ඇත. | ණය වාරික හා පොලිය නියමිත පරිදි ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙතින් ලද තොරතුරු අනුව මණ්ඩලයේ සභාපති නමින් මෝටර් රථ 44 ක් ද, සාමාන්‍යාධිකාරි නමින් මෝටර් රථ 04 ක් ද, මණ්ඩලය නමින් හා එම ලිපිනය යටතේ මෝටර් රථ 10 ක් ත්‍රිරෝද රථ 08 ක් හා යතුරු පැදි 32 ක් ද වශයෙන් ලියාපදිංචි කර තිබූ වාහන අතුරෙන් වාහන 98 ක් මණ්ඩලය තුළ භෞතිකව නොපැවතුණි. | 2012 වර්ෂයේදී මිළදීගත්, ක්ෂේත්‍ර නිළධාරීන් භාරයේ පවතින යතුරු පැදි 08 ක් පිළිබඳ තොරතුරු පමණක් ආයතනය සතුව පවතී. සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් සඳහා පොළී රහිත ණය යෝජනා ක්‍රමයක් යටතේ, නිකුත් කල දින සිට වසර පහක් යනතෙක් වාහනයේ අයිතිය මණ්ඩලය සතුවන බවට කොන්දේසියක් මත යතුරුපැදි 30 ක් ලබාදී තිබුණි. ඉන් යතුරු පැදි 02ක් සඳහා ගෙවීම් සම්පූර්ණ නොකිරීම | මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති වාහන පිළිබඳව සොයා බලා මණ්ඩලය සතු නොවන වාහන අදාළ පාර්ශවයන්ට පැවරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | හේතුවෙන් අයිතිය පවරා දී නොතිබුණු අතර එක් නිළධාරියෙකු විසින් පැවරුම් ලේඛන භාරගෙන ඇති මුත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය වෙතින් පවරා ගෙන නොතිබීම හා තවත් යතුරු පැදි 05 කට අදාළව ද මණ්ඩලයෙන් අයිතිය පවරාගෙන නොතිබුණි. මෙම සියලුම යතුරු පැදි එම නිළධාරීන් සන්තකයේ පවතින අතර මණ්ඩලය නමින් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී නමින් හා මණ්ඩලයේ ලිපිනය යටතේ ලියාපදිංචි සෙසු වාහන පිළිබඳ තොරතුරු ආයතනය සතුව නොපවතී. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මාස 03 ක විකුණුම් නියැදි පරීක්ෂා කිරීමේදී ආයතන 03 ක් සමඟ සිදුකළ රු.819,570,580 ක් වූ ණයට විකුණුම්වලට අදාළව ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබූ අතර තවත් ආයතන 04 කට අදාළව පවතින ගිවිසුම් දීර්ඝ කිරීමෙන් තොරව විකුණුම් සිදුකර තිබුණි. | පසුගිය වර්ෂයට අදාළ ගිවිසුම් ප්‍රකාරවම ඉදිරි වර්ෂවලත් සහල් විකුණුම් සිදු කර ඇති බැවින් ඉදිරියේදී එම කාර්යයන් ගිවිසුම් ගත වීමක් සහිතව සිදු කිරීමට කටයුතු කරනු ඇත. | ණයට විකුණුම්වලට අදාළව ගිවිසුම්වලට එළඹිය යුතු අතර එම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ පාලනය**

**4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 චක්‍රලේඛය මඟින් හඳුන්වාදෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ වසර 3 ක පමණ ප්‍රමාද කාලයක් සහිතව 2025 මාර්තු 18 දින වන අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණිත දිනය වූ 2025 ජුලි 31 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නොතිබුණි. | නියමිත දිනට පෙර මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |